# චතාරික සමයේ සතරවන සතිය
# සෙනසුරාදා

## පළමුවන කියැවීම

ජෙරමියා දිවැස්ප්‍රසාදිතුමන්ගේ පොතෙන් ගත් පාඨයෙකි.

ජෙරමියා 11: 18-22

**මම මරණයට ගෙන යන හීලෑ බැටළුවෙකු මෙන් සිටියෙමි.**

මාගේ සතුරන් මට විරුද්ධව කරන්න අදහස් කළ නපුරු දේ ගැන සමිඳාණන් වහන්සේ මට දැන්වූ බැවින් මම එය දැන ගත්තෙමි. මම මරණයට ගෙන යන හීලෑ බැටළුවෙකු මෙන් සිටියෙමි. 'අපි පල සමඟ ගස සිඳ දමන ලෙස ඔහුගේ නම තවත් ඉතිරි නොවන පිණිස ජීවත්ව සිටින්නන්ගේ දේශයෙන් ඔහු නැති කර දමමු' යි ඔවුන් මට විරුද්ධව උපා යෙදූ බව නොදැන සිටියෙමි.

ජෙරමියා යාච්ඤා කරමින් "යුක්ති සහගත ලෙස විනිශ්චය කරන හෘදයත්, සිතත් විමසන සියලු බලැති සමිඳුනි, මාගේ නඩුව මා ඔබ ඉදිරියෙහි තබා ඇති බැවින් ඔවුන්ගෙන් ඔබ පළිගනු දැකීමට මට ඉඩ ලැබේවා! යි කීය.

දේව වාක්‍යය එසේය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 7 : 1-2, 8-11

පිළිතුර: සමිඳුනි, මාගේ දෙවියනි මා රැකවරණය ඔබ වෙතම ය.

ගීය:

සමිඳුනි, මාගේ දෙවියනි, මා රැකවරණය ඔබ වෙතම ය. ලුහුබැඳ එන රුදු කැලෙන් නිදහස් කොට මා මුදාලන්න. නැතහොත් ගලවන්නට බැරි තැනකට සිංහයෙකු මෙන් ඔවුන් මා ඩැහැගෙන යනු ඇත. එහිදී මා කැබලි කොට මරා දමනු ඇත.

සමිඳාණෝ සව් සත හට යුක්තිය සලසා දෙන සේක. සමිඳුනි, මාගේ දැහැමිකමත්, අහිංසකකමත් අනුව මා විනිශ්වය කළ මැනව. මිනිස් සිතෙහි සිතුම් පැතුම් විමසාලන දැහැමිකමින් අගතැන් පත් දෙව් උතුමාණෙනි, අදමිටුකම් බිඳ දමන්න. දහම් රජය පිහිටුවන්න.

දෙවිඳාණෝ මට රැකවරණය දෙන පලිහ වන සේක. අවංක සිත් ඇතියන් හට පිළිසරණ වන සේක. දෙවිඳාණෝ දැහැමි විනිසකරුවෙක් වන සේක. අදමිටු අය නිති වරදට පත් කරන සේක.

## සාධුකාරය

මම නැඟිට මාගේ පියා වෙත ගොස් මෙසේ කියමි.
"පියාණෙනි මම දෙවියන් වහන්සේට විරුද්ධව ද ඔබට විරුද්ධව ද පව් කළෙමි."

## සුවිශේෂය

සුවිශේෂක ජුවාම් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

ජුවාම් 7: 40–52

***සමහරෙක් උන් වහන්සේ අල්ලා ගැනීමට සිතූහ.***

මේ වචන ඇසූ කල සෙනගගෙන් සමහරු "මෙතුමාණෝ සැබැවින්ම ඒ දිවැසිවරයාණෝ" යි කීහ. අන් සමහරු "මේ ක්‍රිස්තුස් ය"යි කීහ. තවත් සමහරු ක්‍රිස්තුවරයාණන් වඩින්නේ ගලීලයෙන් ද? ක්‍රිස්තුවරයාණන් දාවිත්ගේ වංශයෙන් දාවිත් විසූ ගම වන බෙත්ලෙහෙමෙන් වඩින බව ශුද්ධ ලියවිල්ලෙහි ලියා නැද්දැ"යි ඇසූහ. මෙසේ උන් වහන්සේ නිසා සමූහයා අතරේ භේදයක් හට ගත්තේය. ඔවුන් අතරෙන් සමහරෙක් උන් වහන්සේ අල්ලා ගන්නට සිතූහ. එහෙත් කිසිවෙක් උන් වහන්සේ පිට අත නොතැබූහ.

ඉක්බිති, මුර සේවකයෝ නායක පූජකයන් ද පරිසිවරුන් ද වෙත පෙරළා පැමිණියහ. ඔව්හු ද "තුඹලා ඔහු නොගෙනාවේ මන්දැ"යි ඇසූහ. "කවර මිනිසෙක් වත් මෙසේ කතා නොකළේය" යි මුර සේවකයෝ පිළිතුරු දුන්හ. පරිසිවරු පිළිතුරු දෙමින් "තුඹලාත් මුළා වූවාහු ද? ප්‍රධානීන්ගෙන් වත් පරිසිවරුන්ගෙන් වත් කිසිවෙක් ඔහු අදහා ගත්තෝ ද? ව්‍යවස්ථාව නොදත් මේ සෙනග ශාප ලද්දෝ ය"යි කීහ. ඔවුන්ගෙන් එක් කෙනෙක් වූ මීට පෙර උන් වහන්සේ වෙත ගිය නිකොදේමුස් කතා කොට "පළමුකොට යම් මිනිසකු ගෙන් කරුණු නොවිමසා ඔහු කරන්නේ කුමක්දැ"යි තේරුම් නොගෙන, අපේ ව්‍යවස්ථාව අනුව ඔහු විනිශ්චය කළ හැකිදැ"යි

ඔවුන්ගෙන් ඇසීය. ඔව්හු පිළිතුරු දෙමින් “ඔබත් ගලීලයෙක් ද? ගලීලයෙන් දිවැසිවරයෙක් එන්නේ ද කියා සොයා බලන්නැ”යි කීහ.

**සුවිශේෂ වාක්‍යය එසේ ය.**